# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DDD/HO/11/IT/ebank-officer training | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2024.03.27 |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්

**<u>සමෘද්ධි බැංකු පරිගණක මෘදුකාංගයේ සිදුකරන ලද නව සංවර්ධන කටයුතු පිළිබඳ දැනුවත් කිරීම.</u>**

සමෘද්ධි බැකු පරිගණක මෘදුකාංගය ක්‍රියාත්මකවන සමෘද්ධි බැංකු වල පරිගණක මෘදුකාංගය මගින් දෛනික ගණුදෙනු කටයුතු සිදුකිරීම මේ වන විට සාර්ථකව සිදු කරන අතර මැනුවල් ක්‍රියාවලියේ ගැටළු මත ප්‍රමාදවූ බැංකු කීපයක් හැර සියළුම බැංකු ඉතා සාර්ථකව පද්ධතිය තුල කටයුතු සිදුකරනු ලැබීම සතුටට කරුණකි.

02. පසුගිය දිනවල ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛණ අනුව සමෘද්ධි බැංකු පරිගණක මාදුකාංගය තුල සංවර්ධනය කල යුතු වූ කාර්යයන් සහ මෘදුකාංග සංවර්ධන ආයතනය විසින් පද්ධති තුල කාලීනව සිදුකල යුතු යාවත්කාලීන කිරීම් රාශියක් මේ වන විට සිදුකර ඇත.

01. නව ණයවර්ග පද්ධතියට ඇතුලත් කිරීම ( අරුණළු, ලක්ජය, ලක්වාසනා )
02. ජංගම දුරකථන යෙදවුමෙහි සංවර්ධන කටයුතු
03. නිලධාරී ස්ථාන මාරුවීම් පද්ධතිය තුලින් කළමණාකරනය කිරීම
04. මුරපද නිකුත් කිරීමේ නව ක්‍රමවේදය
05. මුදල් සේප්පුව සහ මුදල් ලාච්චුව
06. කෙටි පණිවිඩ සේවාව (S.M.S. )
07. MANUAL ක්‍රමය අතහැරීම හා ඒ සම්බන්ධව පැනනැගී තිබූ ගැටළු වලට අදාල සංවර්ධන කටයුතු.
08. ණය පොලී ගණනයට අදාල නව ක්‍රමවේදය.

03. පද්ධතිය තුල සිදුකරන ලද උක්ත යාවත්කාලීන කටයුතු හඳුන්වා දීම සහ අදාල කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව සමෘද්ධි බැංකු කළමණාකරුවන් ඇතුළු නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් සැලසුම් කර ඇති අතර මෙම වැඩසටහන පහත සඳහන් කාල සටහන අනුව මාර්ගගත ක්‍රමය ( ZOOM Meeting ) ඔස්සේ පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

04. එක් එක් පළාත තුල ඇති බැංකු සංඛ්‍යාව සහ නිලධාරීන් ප්‍රමාණය සැලකිල්ලට ගෙන වැඩසටහන් කීපයක් ලෙස සැලසුම් කර ඇති අතර සෑම නිලධාරියෙකුම ලබාදී ඇති උපසේ අනුව අදාල වැඩසටහනට පමණක් සහභාගී වීමට වග බලාගත යුතුය.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28** |
| | | **Hot Line :0112-889007** | | | |

| කාල සටහන | | |
|---|---|---|
| **දිනය** | **දිස්ත්‍රික්කය** | **වේලාව** |
| මාර්තු 28 | මාතලේ, මහනුවර, නුවරඑළිය | ප:ව: 1.00 |
| අප්‍රේල් 1 | කොළඹ, ගම්පහ , කළුතර | පෙ:ව: 11.00 |
| අප්‍රේල් 1 | පුත්තලම, කුරුණෑගල | ප:ව: 2.00 |
| අප්‍රේල් 2 | හම්බන්තොට, මාතර, ගාල්ල | ප:ව: 1.00 |
| අප්‍රේල් 3 | බදුල්ල , මොණරාගල | ප:ව: 1.00 |
| අප්‍රේල් 4 | කෑගල්ල, රත්නපුර | ප:ව: 1.00 |
| අප්‍රේල් 5 | අනුරාධපුරයි, පොලොන්නරුව | පෙ:ව: 11.00 |
| අප්‍රේල් 5 | යාපනය, කිලිනොච්චි, මන්නාරම, මුලතිව , වවුනියාව | ප:ව: 2.00 |
| අප්‍රේල් 8 | ත්‍රිකුණාමලය , මඩකලපුව, අම්පාර | ප:ව: 1.00 |

දිස්ත්‍රික්කයේ පහත සඳහන් නිලධාරීන් මෙම වැඩසටහන සඳහා අනිවාර්යයෙන්ම සහභාගී කරවිය යුතුය.

1. දිස්ත්‍රික් අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ
2. දිස්ත්‍රික් කාර්යාලයේබැංකු විෂය කළමණාකරු /බැංකු අධීක්ෂණ කළමණාකරු/ අභ්‍යන්තර විගණන නිලධාරී
3. දිස්ත්‍රික්කයේ සියළුම තොරතුරු තාක්ෂණ නිලධාරීන්
4. සමෘද්ධි බැංකු සමිතිය - සමෘද්ධි බැංකු සමිති කළමණාකරු
5. සමෘද්ධි බැංකුව - සමෘද්ධි බැංකු කළමණාකරු / කාර්ය මණ්ඩලය
   ( සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය තනි USER කෙනෙකු ලෙස එක් LOGIN එකකින් උපාංග හරහා සම්බන්ධ විය යුතුය.)

05. ඒ ඒ පලාත වෙනුවෙන් සකස්කරනු ලබන ZOOM LINK එක SAMURDHI EXCEUTIVE GROUP මගින් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරු වෙත ලබාදීමට කටයුතු කරන අතර තම දිස්ත්‍රික්කය තුල අවශ්‍ය නිලධාරීන්ට සබඳතාවය ලබාදී සහභාගී කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

සී. ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්:**

1. අතිරේක ලේකම් (සංවර්ධන) : කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
2. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කා.දැ.ස.සහ අ.ක.ස
3. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) - කා.දැ.ස.සහ අවශ්‍ය නිලධාරීන් සම්බන්ධ කිරීම සඳහා